සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය 2021

**6 ශ්‍රේණිය** **ගණිතය** **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.

01. පරිසරයේ දැකිය හැකි වෘත්තාකාර හැඩතල දෙකක් ලියන්න.

..................................................... .....................................................

02. $25 \div 7$ හි ලබ්ධිය හා ශේෂය ලියන්න.

ලබ්ධිය .......................... ශේෂය ..........................

03. සුළු කරන්න. $\frac{3}{7} - \frac{9}{28}$

04. ජාතික නිදහස් දිනය එක්දහස් නවසිය හතළිස් අටේ පෙබරවාරි මස හතර වේ. එම දිනය සම්මත ආකාරයෙන් දක්වන්න.

.....................................................

05. රූපයේ පරිමිතිය සොයන්න.




06. 80 m දිග කාණුවකින් 14 m 60 cm ක් කපා නිම කර ඇත. කැපීමට ඉතිරි කාණුවේ දිග ප්‍රමාණය සොයන්න.

07. දී ඇති සංඛ්‍යා රේඛාව මත -2, 3 නිඛිල නිරූපණය කරන්න.




08. 3 හි තුන්වල බලයේ අගය කීයද?

09. නිවැරදිව යා කරන්න.

| A | B |
|---|---|
| දින 3 | තත්පර 300 |
| පැය 1 | මිනිත්තු 4 |
| තත්පර 240 | මිනිත්තු 60 |
| මිනිත්තු 5 | පැය 72 |

10. හිස්තැනට <, >, = අතරින් සුදුසු සංකේතය යොදන්න.

0.2 ......... 0.20

11. පහත රූපය නිරීක්ෂණයෙන් එම රූපයේ ඇති මුළු තිත් ප්‍රමාණය නිමානය කරන්න.



...............................

12. සරල රේඛීය සංවෘත තල රූප දෙකක් අඳින්න.

..................................................... .....................................................

13. පරිසරයේ දැකිය හැකි ඝනකාභ හැඩති වස්තු දෙකක් නම් කරන්න.

..................................................... .....................................................

14. 20 ත් 50 ත් අතර හතෙහි ගුණාකාර සියල්ල ලියන්න. ............................................................

15. මහීෂගේ උස 125 cm කි. එය ආසන්න දහයට වටයා ලියන්න. ...............................................

16. දී ඇති පළතුරු වර්ග කාණ්ඩ දෙකකට වෙන් කර ඒවා හැඳින්වීමට සුදුසු නාම ලියන්න.




...............................

...............................

17. $633 \times 127$ හි සුළු කිරීම සිදු නොකර පිළිතුර ලෙස ලැබෙන සංඛ්‍යාව ඔත්ත සංඛ්‍යාවක්ද ඉරට්ට සංඛ්‍යාවක්ද යන්න ලියන්න. ...............................................

18. 2 න්, 5 න්, 10 න් යන සංඛ්‍යා තුනෙන්ම ඉතිරි නැතිව බෙදෙන කුඩාම සංඛ්‍යාව කීයද?

...............................................

19. 3 2 7 0 5 1 යන සංඛ්‍යාවේ 2 න් නිරූපිත අගය 5 න් නිරූපිත අගය මෙන් කී ගුණයක්ද?

...............................................

20. $a = 3$ හා $b = 2$ නම් පහත වීජීය ප්‍රකාශනයේ අගය සොයන්න.

$4a - 3b$

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සඳහා ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරට ලකුණු 11 බැගින් ද ලැබේ.**

01. a) රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) කුඹුර පිහිටියේ නිවසට කවර දිශාවෙන්ද? (ල.01)

(ii) අඹ ගසට කවර දිශාවෙන් ළිඳ පිහිටියේද? (ල.02)

(iii) නිවසට නිරිත දිශාවෙන් එළවළු කොටුව දක්වන්න. (ල.02)

b) (i) ඝනකයක පතරම ඇඳ දක්වන්න. (ල.02)

(ii) ඉහත පතරම මගින් සෑදෙන ඝන වස්තුවේ මුහුණත්, ශීර්ෂ, දාර ගණන ලියන්න.

මුහුණත් ............................ ශීර්ෂ ............................ දාර ............................ (ල.02)

(iii) පහත පතරම් අතරින් සවිධි චතුස්තලයක් සෑදිය හැකි පතරම් යටින් ඉරක් අඳින්න. (ල.02)



c)  1 cm / 1 cm මගින් 1 $cm^2$ ක ප්‍රමාණයක් නිරූපණය වෙයි නම් පහත එක් එක් රූපවල වර්ගඵලය සොයන්න.

(i)  (ii)  (iii) 

.......................... (ල.01) .......................... (ල.02) .......................... (ල.02)

02. a) (i) පහත රූපයේ දක්වා ඇති කෝණ වර්ග නම් කරන්න.




a ....................................................

b ....................................................

c .................................................... (ල.02)

(ii) මෙම රූපය ඇතුලත ඇති මුළු ඍජු කෝණ ගණන කීයද? .......................................... (ල.02)

(iii) සරල කෝණයක් ඇඳ ලකුණු කර දක්වන්න. (ල.02)

b) පහත සටහන අධ්‍යයන කර හිස්තැන්වලට සුදුසු තල රූප අඳින්න. ඒවා හඳුන්වන නම ලියන්න.

චතුරස්‍ර

- සියළු කෝණ සෘජුකෝණවන
  - සම්මුඛ පාද යුගල දිගින් සමාන
  - සියළු පාද දිගින් සමාන
- සියළු කෝණ සෘජුකෝණ නොවන
  - සියළු පාද දිගින් සමාන
  - සම්මුඛ පාද යුගල දිගින් සමාන

| | | | |
|---|---|---|---|
| ............................ | ............................ | ............................ | ............................ |
| රූපය | රූපය | රූපය | රූපය |
| ........................... | ........................... | ........................... | ........................... |
| නම | නම | නම | නම |

---

03. a) පහත ප්‍රකාශන අතරින් ඥාත හා අඥාත ලියන්න.

- ♦ අවුරුද්දට ඇති මාස ගණන ..............................
- ♦ ගසක ඇති රඹුටන් ගෙඩි ගණන ..............................
- ♦ 0 ත් 10 ත් අතර සංයුක්ත සංඛ්‍යා ගණන ..............................
- ♦ දිනකට කතා කරන වචන ගණන ..............................
- ♦ බස්නැවතුමක රැඳී සිටීමට ගතවන කාලය .............................. (ල.02)

b) පහත දැක්වෙන ප්‍රමාණ විජීය සංකේත මගින් නිරූපණය කරන්න.

- ♦ වනයක ඇති ගස් ගණන ..............................
- ♦ වැවක ඇති ජලය ප්‍රමාණය ..............................

c) උත්සවයකට පැමිණි පිරිසක් අතරින් පැයකට පසු 15 දෙනෙක් පිටත්ව ගියේ ය.

(i) පැයකට පසු උත්සවයේ ඉතිරි පිරිස වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. .................................. (ල.02)

(ii) උත්සවයට පැමිණි පිරිස 53 ක් නම් පැයකට පසුව උත්සවයේ රැඳී සිටි පිරිස කොපමණද?

............................. (ල.02)

04. පහත ප්‍රහේලිකාව නිවැරදිව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

(1) ඉලක්කම් දෙකකින් යුත් විශාලම ඉරට්ට සංඛ්‍යාව වේ.

(2) 12 වන සමචතුරස්‍ර සංඛ්‍යාව මෙය වේ.

(4) ත්‍රිකෝණ සංඛ්‍යාවකි.

(6) මුල්ම ප්‍රථමක සංඛ්‍යා හතරේ එකතුව මෙය වේ.

<u>පහළට</u>

(3) 10 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවකි.

(5) 150 ට අඩු විශාලම 7 ගුණාකාරය මෙය වේ.

(7) ඉරට්ටේ ප්‍රථමක සංඛ්‍යාවකි.

(8) ත්‍රිකෝණ හා සමචතුරස්‍ර සංඛ්‍යාවක් වන කුඩාම සංඛ්‍යාව මෙය වේ.




---

05. 6 ශ්‍රේණියේ සිසුන් පිරිසකගේ උපන් මාස පිළිබඳ විමසීමකදී පහත තොරතුරු ලැබුණි.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | මාර්තු | පෙබරවාරි | ජනවාරි | මාර්තු | මැයි | මාර්තු | මැයි | පෙබරවාරි | ජනවාරි |
| අප්‍රේල් | මැයි | ජනවාරි | පෙබරවාරි | ජනවාරි | අප්‍රේල් | මැයි | මැයි | පෙබරවාරි | ජනවාරි |
| මාර්තු | අප්‍රේල් | පෙබරවාරි | ජනවාරි | මාර්තු | මැයි | ජනවාරි | මාර්තු | මැයි | අප්‍රේල් |

i) මෙම තොරතුරු පහත වගුවට ඇතුලත් කරන්න.

| මාසය | ප්‍රගණන ලකුණු | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | | |
| පෙබරවාරි | | |
| මාර්තු | | |
| අප්‍රේල් | | |
| මැයි | | |

ii) ◯ = 4 නිරූපණය වන පරිදි ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න.

06. a) i) 1050 ml ද්‍රව ප්‍රමාණය ලීටර හා මිලිලීටර වලින් දක්වන්න. .................................................

සුළු කරන්න.

ii)

| | $l$ | $ml$ |
|---|---|---|
| | 3 | 750 |
| + | 2 | 450 |
| | | |

iii)

| | $l$ | $ml$ |
|---|---|---|
| | 4 | 200 |
| − | 2 | 460 |
| | | |

b) සටහනට අනුව සීනිවල ස්කන්ධය ග්‍රෑම් කොපමණද?

...............................................




07. a) i) "එකයි දශම හතයි තුන" යන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

ii) ඉහත සංඛ්‍යාව ගණක රාමුවක දක්වන්න.

iii) එක් එක් සංඛ්‍යාවේ නිරූපිත වටිනාකම ලියන්න.

b) 40320156432 යන සංඛ්‍යාව

i) සම්මත ආකාරයට (කලාපවලට වෙන් කර) ලියන්න.

ii) ඉහත සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න.

c) ජනනි, පැවරුම් නිම කිරීමේ කාලය මිනිත්තු 50 ලෙසත් මතීෂ පැවරුම් නිම කිරීමේ කාලය පැය 1 මිනිත්තු 40 ලෙසත් පවසයි. ජනනි හා මතීෂ පැවරුම් නිම කිරීමේ කාලය අනුපාතයක් ලෙස ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න.

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | නිවැරදි වෘත්ත හැඩ දෙකක් සඳහා | | 02 |
| 02. | ලබ්ධිය 3 | 01 | |
| | ශේෂය 4 | 01 | 02 |
| 03. | $\frac{3}{28}$ <br> $\frac{12}{28}$ ගැනීම | 01 | 02 |
| 04. | 1948-02-04 | | 02 |
| 05. | 24 cm | | 02 |
| | ( 7 + 5 + 7 + 5 ) cm | 01 | |
| 06. | 65 m 40 cm | | 02 |
| | 80.00 <br> - 14.60 ලෙස දැක්වීම | 01 | |
| 07. |   | 01 <br> 01 | 02 |
| 08. | 27 $3^3$ දැක්වීම | 01 | 02 |
| 09. |   | | 02 |
| 10. | = | | 02 |
| 11. | 5 x 26 | 01 | |
| | 130 | | 02 |
| 12. | නිවැරදි සංවෘත නල රූප 2 ක් සඳහා | | 02 |
| 13. | නිවැරදි ඝනකාභ හැඩ වස්තු දෙකක් සඳහා | | 02 |
| 14. | 21, 28, 35, 42, 49 | | 02 |
| 15. | 130 cm | | 02 |

| | | | |
|---|---|---|---|
| 16. | රඹුටන්, වෙරළු අලිගැටපේර, අඹ — එක් බීජයක් ඇති | 01 | |
| | දිවුල්, බෙලි ගස්ලබු, පැණිකොමඩු — බීජ රාශියක් ඇති | 01 | |
| | හෝ නිවැරදි කාණ්ඩ කිරීම් සඳහා | | 02 |
| 17. | ඔත්ත සංඛ්‍යාවකි. | | 02 |
| | 3 x 7 = 21 | | |
| 18. | 10 | | 02 |
| 19. | 400 | | 02 |
| | $\frac{20000}{50}$ | 01 | |
| 20. | 6 | | 02 |
| | 4 x 3 - 3 x 2 | 01 | |

### II කොටස

| | | | |
|---|---|---|---|
| 01. | a) (i) ගිණිකොණ දිශාව | 01 | |
| | (ii) ඊසාන දිශාව | 02 | |
| | (iii)   | 02 | 05 |
| | b) (i) නිවැරදි පතරමක් සඳහා | 02 | |
| | (ii) මුහුණත් 6 ශීර්ෂ 8 | | |
| | දාර 12 | 02 | |
| | (iii)  | 01 | |
| | | 01 | 06 |
| | c) (i) 9 $cm^2$ | 01 | |
| | (ii) 8 $cm^2$ | 02 | |
| | (iii) 6 $cm^2$ | 02 | 05 |
| | | | **16** |

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 02. | a) (i) a - මහා කෝණය | 01 | |
| | b - සුළු කෝණය | 01 | |
| | c - පරාවර්ත කෝණය | 01 | |
| | (ii) 18 | 01 | |
| | (iii)  | 02 | 06 |
| | b)   | 05 | 05 |
| | | | **11** |

| | | | |
|---|---|---|---|
| 03. | a) ඥාත | 01 | |
| | අඥාත | 01 | |
| | ඥාත | 01 | |
| | අඥාත | 01 | |
| | අඥාත | 01 | 05 |
| | b) සුදුසු වීජීය සංකේත දෙකක් සඳහා | 01 | |
| | | 01 | 02 |
| | c) (i) a - 15 ආදී නිවැරදි වීජීය ප්‍රකාශනයක් සඳහා | 01 | 02 |
| | (ii) 38<br>53 - 15 | 01 | 02 |
| | | | **11** |

04.

| | | | |
|---|---|---|---|
| (1) 9 | (3) 8 | ▨ | (5) 1 |
| ▨ | (2) 1 | 4 | 4 |
| (4) 1 | 0 | ▨ | 7 |
| ▨ | ▨ | (8) 1 | ▨ |
| (6) 1 | 7 | ▨ | (7) 2 |

| | | |
|---|---|---|
| (1) | 01 | |
| (2) | 02 | |
| (3) | 01 | |
| (4) | 02 | |
| (5) | 01 | |
| (6) | 02 | |
| (7) | 01 | |
| (8) | 01 | 11 |
| | | **11** |

05. (i)

| | | | | |
|---|---|---|---|---|
| ජන. | 卌 /// | 8 | 02 | |
| පෙබ. | 卌 | 5 | 01 | |
| මාර්. | 卌 / | 6 | 01 | |
| අප්‍රේ. | //// | 4 | 01 | |
| මැයි | 卌 // | 7 | 01 | 06 |

(ii) 


| | | |
|---|---|---|
| ජන. | 01 | |
| පෙබ. | 01 | |
| මාර්. | 01 | |
| අප්‍රේ. | 01 | |
| මැයි | 01 | 05 |
| | | **11** |

| | | | |
|---|---|---|---|
| 06. | a) (i) 1 *l* 50 *ml* | 02 | |
| | (ii) 6 *l* 200 *ml* | 02 | |
| | (iii) 1 *l* 740 *ml* | 02 | 06 |
| | b) 1 kg 200 g | 05 | 05 |
| | | | **11** |

| | | | |
|---|---|---|---|
| 07. | a) (i) 1.73 | 01 | |
| | (ii)  1, $\frac{1}{10}$, $\frac{1}{100}$ | 02 | |
| | (iii)   | 01<br>01<br>01 | 06 |
| | b) (i) 40 320 156 432 | 01 | |
| | (ii) හතළිස් බිලියන තුන්සිය විසි මිලියන එකසිය පනස් හය දහස් හාරසිය තිස් දෙක | 02 | 03 |
| | c) මිනි. 50   පැය 1 මිනි. 40 | | |
| | මිනි. 50   මිනි. 100 | | |
| | 50 : 100 | 01 | |
| | 1 : 2 | 01 | 02 |
| | | | **11** |